2026.06.29

සභාපතිතුමා,
රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව (COPF)
ශ්‍රී ලංකා පාලර්මේන්තුව
ශ්‍රී ජයවධර්නපුර

ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් අනාවරණය කරන ලද ඇමරිකානු ඩොලර් බිලියන 1ක පද්ධතිමය විදේශ විනිමය වංචාව සම්බන්ධයෙන් නියාමන හා බලාත්මක කිරීමේ ආයතන කාරක සභාව හමුවට කැඳවීම පිළිබඳව

ගරු සභාපතිතුමනි,

ජාතියේ ආර්ථික පදනම කම්පනයට පත් කර ඇති අතිශය බරපතළ මූල්‍ය හෙළිදරව්වක් සම්බන්ධයෙන්, විශේෂයෙන්ම ජනාධිපතිතුමා කළ ප්‍රකාශය සත්‍ය බව තහවුරු වුවහොත්, දැඩි හදිසිභාවයකින් හා වගකීමකින් යුතුව මෙම ලිපිය ඔබ වෙත යොමු කරමි.

රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ (COPF) සාමාජිකයින් වශයෙන්, රාජ්‍ය මුදල් පිළිබඳ පාලර්මේන්තු අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා ආරක්ෂා කිරීම අප වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීමකි. පාලර්මේන්තුවේදී සිදුකර ඇති මෑතකාලීන බලයලත් හෙළිදරව් කිරීම් හමුවේ, මෙම කාරක සභාවට තම අධීක්ෂණ වගකීම ප්‍රමාද කිරීමට, කල් දැමීමට හෝ සුළුකොට සැලකීමට කිසිදු අවකාශයක් නොමැති බව මම දැඩි ලෙස අවධාරණය කරමි. එසේ කිරීම පාලර්මේන්තුවටත් ශ්‍රී ලංකාවේ ජනතාවටත් අප සතු වගකීම පැහැර හැරීමක් වනු ඇත.

## පද්ධතිමය අසාර්කත්වයේ පසුබිම

මෙම කාරක සභාව රාජ්‍යයේ ඉහළම විධායක හා ආරක්ෂක බලධාරීන් විසින් සිදුකර ඇති පහත දැක්වෙන හෙළිදරව් කිරීම් නිල වශයෙන් සලකා බැලිය යුතුය.

### *1. විධායක හෙළිදරව්ව*

මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවධර්න අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා 2024 වසරේ සිට ශ්‍රී ලංකාව ඇමරිකානු ඩොලර් බිලියන 1ක් (රුපියල් බිලියන 340කට ආසන්න) පමණ අහිමි වී ඇති බව අනාවරණය කළේය. මෙම විදේශ විනිමය අහිමිවීම වංචනික ටෙලිග්‍රැෆික් මුදල් මාරු කිරීම් (Telegraphic Transfers - TT) සහ කිසිදු භාණ්ඩයක් මෙරටට ආනයනය නොකළ ව්‍යාජ අත්තිකාරම් ගෙවීම් මගින් සිදුකර තිබේ.

තවද, ජනාධිපතිතුමා නිශ්චිත වාණිජ බැංකු ශාඛා මෙම වංචාවට සම්බන්ධ වූ බවත්, ඇතැම් ශාඛා කළමනාකරුවන් වෙනත් ප්‍රදේශවලට මාරු කළ පසුවද එම වංචනික ක්‍රියාකාරකම් නැවත නැවත සිදුකර ඇති බවත් ප්‍රකාශ කළේය.

### *2. ආරක්ෂක අංශ හෙළිදරව්ව*

මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා බහු ආයතනික විමශර්නවල තොරතුරු අනාවරණය කරමින්, වෙළෙඳාම මත පදනම් වූ මුදල් විශුද්ධිකරණ (Trade-Based Money Laundering) ජාලයක් පිළිබඳ තොරතුරු හෙළි කළේය. එක් විමශර්නයකදී පමණක් රුපියල් බිලියන 12.89ක් ගනුදෙනු 953ක් මගින් විදේශගත කර තිබූ බවත්, කුඩා සංවිධානාත්මක කණ්ඩායම් විසින් දේශීය කවච සමාගම් (Shell Companies) 105ක් පිහිටුවා මාස හයක පමණ කාලයක් තුළ විදේශ විනිමය පිටතට ගෙන ගොස් පසුව එම සමාගම් වසා දැමූ බවත් අනාවරණය කර ඇත.

## ක්‍රිප්ටෝ මුදල් පිළිබඳ නීතිමය තත්ත්වය සහ පෙර කළ අනතුරු ඇඟවීම්

ගරු සභාපතිතුමනි,

මෙම විමශර්නය ආරම්භ කරන අවස්ථාවේදී වෙළෙඳාම මත පදනම් වූ වංචාවන් පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නොවේ.

2025 ජනවාරි 21 දින COPF රැස්වීමේදී ශ්‍රී ලංකාවේ ක්‍රිප්ටෝ මුදල්වල නීතිමය තත්ත්වය පිළිබඳව මා විසින් මතු කළ කරුණද මෙම විමශර්නයේ කොටසක් විය යුතු බව මම ඉල්ලා සිටිමි.

එම අවස්ථාවේදී මා පෙන්වා දුන්නේ නියාමනය නොකළ ඩිජිටල් මුදල් පද්ධති විශාල ප්‍රමාණයේ ප්‍රාග්ධන පලායාමට හා බදු මගහැරීමට ඉතා පහසු පසුබිමක් සපයන බවයි. පුද්ගලයන් හෝ ආයතන බදු නොගෙවා ශ්‍රී ලංකාවෙන් බිලියන ගණනක මුදල් පිටතට ගෙන යමින් සිටී නම්, ක්‍රිප්ටෝ මුදල් පිළිබඳ නීතිමය අපැහැදිලිභාවය සහ වෙළෙඳාම මත පදනම් වූ වංචා එකිනෙකට සම්බන්ධ වී තිබේද යන්න සොයා බැලිය යුතුය.

එබැවින්, වසරකට වැඩි කාලයකට පෙර මා විසින් මතු කළ මෙම නියාමන අනතුරු ඇඟවීම් පිළිබඳව මහ බැංකුව නිසි ක්‍රියාමාගර් නොගත්තේ මන්ද යන්නද COPF විසින් විධිමත්ව සොයා බැලිය යුතුය.

## අතිශය බරපතළ ප්‍රශ්නය - ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණ අසාථර්කත්වය

2026 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සහ 2026 අංක 02 දරන අපනයන ආදායම් නැවත ගෙන්වා ගැනීමේ නීති මගින් හදිසි ක්‍රියාමාගර් ගෙන තිබුණද, මූලික ප්‍රශ්නය තවමත් පිළිතුරු රහිතය.

## මෙම කාලය පුරා ශ්‍රී ලංකා මහ බැංකුව සිටියේ කොතැනද?

වාණිජ බැංකු 13ක් හරහා බැංකු ගිණුම් 227ක් භාවිතයෙන් වංචනික TT ගනුදෙනු 26,108කට අධික සංඛ්‍යාවක් සිදුව තිබීම පද්ධතිමය නියාමන අසාථර්කත්වයකි.

මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාතර්මේන්තුව (BSD) සහ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) වෙත බැංකු පද්ධතිය නිරීක්ෂණය කිරීම, අවදානම් හඳුනා ගැනීම සහ ජාත්‍යන්තර මුදල් ප්‍රවාහයන් අධීක්ෂණය කිරීම සඳහා පුළුල් නීතිමය බලතල තිබේ.

වසර දෙකක කාලයක් තුළ රුපියල් බිලියන 340ක් මෙරට බැංකු පද්ධතිය හරහා පිටතට ගමන් කිරීම ස්වයංක්‍රීය නිරීක්ෂණ පද්ධති හෝ විදේශ ගනුදෙනු සීමා ඉක්මවන අනතුරු ඇඟවීම් මගින් හඳුනා නොගැනීම ව්‍යුහාත්මකව පිළිගත නොහැකිය.

අඩු ආදායම්ලාභී පුද්ගලයින් 36 දෙනෙකුගේ නමින් විවෘත කළ ගිණුම් භාවිත කරමින් කවච සමාගම් 105ක් ක්‍රියාත්මක වී තිබීම "ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීම" (KYC) සහ මුදල් විශුද්ධිකරණ විරෝධී (AML) ක්‍රමවේදයන් සම්පූණර්යෙන් අසාථර්ක වූ බව හෝ අභ්‍යන්තරයෙන් බිඳවැටී ඇති බව පෙන්නුම් කරයි.

## කාරක සභාව හමුවට කැඳවිය යුතු ආයතන

මෙම බහු බිලියන රුපියල් වටිනා අපරාධයේ බරපතළභාවය සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් ආයතන COPF හමුවට වහාම කැඳවා, අදාළ ලේඛන හා පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට නියෝග කළ යුතු බව මම යෝජනා කරමි.

ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් - 2024 සිට 2026 දක්වා බැංකු අධීක්ෂණ දෙපාතර්මේන්තුව (BSD) සහ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සිදු කළ හෝ සිදු නොකළ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වගකීම් පැහැදිලි කිරීම සඳහා.

ආනයන හා අපනයන පාලක ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා - බැංකු හරහා සිදු වූ විදේශ ගෙවීම් සහ සැබෑ භාණ්ඩ ආනයනය අතර තත්කාලීන දත්ත සම්බන්ධීකරණයක් නොතිබීමට හේතු පැහැදිලි කිරීම සඳහා.

මෙම සිද්ධියට අදාළ වාණිජ බැංකු 13හි ප්‍රධාන අනුකූලතා නිලධාරීන් (Chief Compliance Officers) - අභ්‍යන්තර පාලන අසාර්ථකත්වයන් සහ වංචාවට සම්බන්ධ ශාඛා කළමනාකරුවන්ගේ මාරු කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා.

COPF හි බලතල යටතේ අවශ්‍ය යැයි සැලකෙන වෙනත් රාජ්‍ය හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන - හරස් ප්‍රශ්න කිරීම සඳහා.

## නිගමනය

මෙම කාරක සභාව මෙම සිද්ධිය සම්බන්ධයෙන් දැඩි හා නොසැලෙන ස්ථාවරයක් නොගතහොත්, රාජ්‍ය මුදල් පිළිබඳ අධීක්ෂණය කිරීමේ අපගේ ව්‍යවස්ථාපිත වගකීම අප විසින්ම පැහැර හරිනු ඇත.

මෙවැනි බරපතළ අබුද්දයක් සාමාන්‍ය පරිපාලන දෝෂයක් ලෙස සලකා අමතක කිරීමට අපට ඉඩ දිය නොහැක.

අද ජනතාව අපේක්ෂා කරන්නේ වගවීම ආරම්භ විය යුත්තේ මූල්‍ය අධීක්ෂණයට වගකිව යුතු රාජ්‍ය ආයතනවලින් බවයි. හානිය සිදු වූ පසු විමශර්න නොව, කායර්ක්ෂම වෘත්තිකයන් විසින් මෙහෙයවන ශක්තිමත් පාලන පද්ධතියක් ශ්‍රී ලංකාවට අවශ්‍යය.

එබැවින්, මෙම ආයතනික හරස් විමශර්නය අපගේ මීළඟ COPF රැස්වීමේ ප්‍රධාන න්‍යාය පත්‍ර අයිතමය ලෙස ඇතුළත් කර, අදාළ සියලු ආයතන හැකි ඉක්මනින් කාරක සභාව හමුවට කැඳවන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ඔබතුමාගේ සුපුරුදු කඩිනම් ප්‍රතිචාරය සහ අවශ්‍ය ආයතන වහාම කැඳවීමට ගනු ලබන පියවර අපේක්ෂාවෙන් සිටිමි.

ඔබගේ විශ්වාසී,

රවි කරුණානායක FCMA, CMA
පාර්ලිමේන්තු මන්ත්‍රී

පිටපත්: රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ සියලුම සාමාජිකයන්